සමාජයේ ආදරයට පාත්‍ර වූ තරුවක් දිවි අහිමි කරගත් විට, එයට සාමාන්‍ය දිවි අහිමි කරගැනීමකට වඩා වැඩි අවධානයක් හිමිවේ. එම අවධානය ඔස්සේ අනුකාරක දිවි අහිමි කරගැනීම්ද ඇති වීමේ අවදානමක්ද තිබේ. දිවි අහිමි කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බව පර්යේෂණ ඔස්සේ පෙන්වා දී ඇත. එනිසාම, එවැනි දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදීද ප්‍රවේසම් සහගත, ආචාර ධාර්මික ප්‍රවේශයක් අවශ්‍ය වනු ඇත.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, දිවි අහිමි කරගත් ආකාරය පුවත් වාර්තාවක සඳහන් කිරීම, දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇත්තෙකුට උත්ප්‍රේරකයක් වීමේ ඉඩක් ඇත.

එසේම දිවි අහිමි කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තා සමගින් උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇත්තෙකුගේ ජීවිතය බේරාගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

මෙම පුවත 17 හා 18 දිනවල දිවයින හා අරුණ පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ ප්‍රකාශයට පත්ව නොතිබුණි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1

https://media.samaritans.org/documents/Media_Guidelines_FINAL_v2_TABa8C6.pdf

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina ##Aruna